# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2022/32 - 2017 ජූනි මස 09 වැනි සිකුරාදා - 2017.06.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී )

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### උතුරු මැද පළාතේ පළාත් සභාව

පළාත් සභාවේ ස්ථිරත්වය නිවේදනය කිරීම

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වන වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ උතුරු මැද පළාතේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා විසින් සාදන ලදුව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1960/35 හා 2016.03.30 දිනැති අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද පහත උපලේඛනයේ සඳහන් කෙටුම්පත් සංශෝධන අතුරු ව්‍යවස්ථා 1989 අංක 12 දරන පළාත් සභා (අනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වන වගන්තියේ (3) වන උප වගන්තිය යටතේ උතුරු මැද පළාතේ පළාත් සභාව විසින් 2016.11.29 දින පවත්වන ලද පළාත් සභා රැස්වීමේ දී අනුමත කළ බව මෙයින් නිවේදනය කරමි.

ලේකම්,
පළාත් පාලන අමාත්‍යාංශය,
උතුරු මැද පළාත් සභාව.

2017 ක් වූ අප්‍රේල් මස 26 දින,
ප්‍රධාන අමාත්‍යාශයේ දී ය.

### උපලේඛනය

1. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ බත් කඩ, ආපනශාලා, තේ හෝ කෝපි කඩ පවත්වාගෙන යාම විධිමත් කිරීම අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා
2. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ හෝටල් පවත්වාගෙන යාම විධිමත් කිරීම අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා
3. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පොදු ක්‍රීඩා භූමි විධිමත් කිරීම අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා
4. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ නවාතැන් පොළවල් පවත්වාගෙන යාම විධිමත් කිරීම අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා
5. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ බේකරි පිළිබඳ අතුරු ව්‍යවස්ථා
6. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ප්‍රචාරක දැන්වීම් පිළිබඳ අතුරු ව්‍යවස්ථා
7. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වාහන නතර කිරීම හා වාහන හැසිරවීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා
8. ප්‍රාදේශීය සභාවේ සංචාරක වෙළඳුන් විසින් ආහාර පාන ද්‍රව්‍ය වෙළඳාම් කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා
9. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ මාළු විකිණීම විධිමත් කිරීම අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා
10. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ මස් විකිණීම විධිමත් කිරීම අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා

06 - 880

1A - PG 3557 — 77 (2017/06) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*